# ලක්දිව ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහ

ජේ.එම්.ටී.එම්.ජයවර්ධන

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණය අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
thilinijayawardhana100@gmail.com

ප්‍රමුඛ පදඃගෙඩිගේ, ප්‍රතිමාගෘහ, වාස්තුවිද්‍යාත්මක, සම්ප්‍රදායන්

## හැඳින්වීම

බුදුපිළිමයේ ආරම්භය පිළිබඳ විවිධ මතවාද රැසක් පවතී. වර්තමානයේ මෙන්ම අතීතයේ දී ප්‍රතිමාගෘහය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඇත. මුල් කාලයේ දී බුදු පිළිමය බෝධිය පාමුල හෝ ස්තූපය පාමුල තබා වන්දනාමාන කර ඇත. පසු කාලයේ දී බැතිමතුන් ශ්‍රද්ධා මාර්ගයෙන් භක්ති මාර්ගයට පිවිසි නිසා බුදු පිළිමය සඳහා ගෞරවාන්විතභාවයක් ලබාදීමට මෙන්ම අව් වැසි තත්ත්වවලින් ආරක්ෂා කර වන්දනාමාන කිරීම සඳහා ප්‍රතිමා ගෘහ ඉදි කර ඇත. මුල් කාලයේ දී කුඩාසරල ප්‍රතිමා නිර්මාණය වුවත් පසුකාලීනව පිළිම වන්දනය ජනප්‍රිය වීමත් සමඟ විශාල මෙන් ම අලංකාර සැරසිලිවලින් සමන්විත සංකීර්ණ ප්‍රතිමා නිර්මාණය විය. බෞද්ධ වාස්තුවිද්‍යාත්මක නිර්මාණ අතර සුවිශේෂී නිර්මාණයක් වූ පිළිමගේ, ප්‍රතිමාගෘහය ,පටිමාඝරය ,ප්‍රතිමාඝරයයන නම්වලින් හඳුන්වනනිර්මාණයෙහි එක් වර්ගයක් වන ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහ පිළිබඳ විමසීම මෙහිදී සිදු කරනු ලැබේ.

## ක්‍රමවේදය

පූර්ව අධ්‍යයනයේ දී මූලික වශයෙන් ම ශාස්ත්‍රීය පොත පත පරිශීලනය කරමින් දත්ත එක් රැස් කරගත් අතර ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා ඉන් පසු යොමු විය. එයින් ලබා ගත් තොරතුරු පදනම් කරගෙන ලබාගත් ප්‍රතිඵල මත මෙම අධ්‍යයනය සඳහා ක්‍රමවේදය සකස් කර ගෙන තිබේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මුල් කාලයේ දී ප්‍රතිමාගෘහ නිර්මාණයට පාදක කරගෙන ඇත්තේ බුදුන්වහන්සේ වැඩ සිටි කාලයේ පරිහරණය කරන ලද ගන්ධකුටි සම්ප්‍රදායයි. 10 වෙනි සියවසයට අයත් අභයගිරි සෙල් ලිපියක එම විහාරයෙහි ප්‍රතිමා ගෘහය හඳුන්වා ඇත්තේ '**ගන්දල**'යන වචනයෙනි. එය ගන්ධකුටි යන්නෙන් බිඳුනකි. පසු කාලය වන විට විවිධ හැඩවලින් මේවා නිර්මාණය විය. ද්වාරමණ්ඩපය, අන්තරාලය හා ගර්භගෘහ යනුවෙන් කොටස්වලට බෙදී තිබුණි. වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ පදනම් කරගෙන ලක්දිව නිර්මාණය වූ ප්‍රතිමාගෘහයන්හි භාවිත සම්ප්‍රදායන් කිහිපයක් හඳුනාගෙන තිබේ.

- ගන්ධකුටි සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහ
- ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහ
- ප්‍රසාද වර්ගයේ ප්‍රතිමාගෘහ
- ටැම්පිට විහාර සම්ප්‍රදාය
- ලෙන් විහාර සම්ප්‍රදාය

ලක්දිව බෞද්ධ වාස්තුවිද්‍යාත්මක නිර්මාණ අතර සුවිශේෂී නිර්මාණයක් ලෙස ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහ හඳුන්වාදිය හැකිය. මේවා සඳහා ගෙඩිගේ යන නාමය කිනම් කලක සිට භාවිත කළේ ද යන්න අවිනිශ්චිත ය. මේ පිළිබඳ උගතුන් අතර විවිධ මත පවතී. ලංකා

පුරාවිද්‍යා පාලන වාර්තාවල 1910, 1911 වාර්ෂික වාර්තාවෙහි නාලන්දා ගෙඩිගේ පිළිබඳ විස්තර කරන එච්.සී.පී.බෙල් මහතා ගෙඩිගේ යන්න දෙමළ**ගෙඩිංගේ** යන්නෙන් හෝ සංස්කෘතික **ඝටිකා** යන්නෙන් ප්‍රභවය වූ බව පවසයි. **ක්‍රිෂ්ණ** ශාස්ත්‍රි දක්වන පරිදි ගෙඩිගේ යන්න **නැවතුම්පළ,අම්බලම** යන අරුත් ඇති දෙමළ ගෙඩි යන්නෙන් හෝ භික්ෂුවගේ **පාත්‍රය** යන අරුත් ඇති දෙමළ ගෙඩිංගෙ යන්නෙන් හෝ තත්භව වූවකි (පියසේන, 2001: 29). 12 වැනි සහ 13 වැනි සියවස් අතර කාලයට අයත් රූපසිද්ධියට ලියන ලද සිංහල සන්නයෙහි **'ගිඤ්ජකාවසථ'** යන්න විස්තර කොට තිබෙන්නේ **'සියලු උළුමුවා ගෙහි හෙවත් ගෙඩිගෙහි'** යනුවෙනි. ඒ අනුව මේවා ගඩොලින් නිර්මාණය කරන ලද බවත් උතුරු ඉන්දියාවේ සිට පැමිණි ආදීතම බෞද්ධ ධර්ම දූතයන් වහන්සේලා විසින් මෙම සම්ප්‍රදාය රැගෙන එන්නට ඇති බවත් විද්වත් මතය වේ.

ආදි අනුරාධපුර යුගයේ පටන් ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහ පැවති බව පරණවිතාන සඳහන් කර ඇත. මේ ප්‍රතිමා ගෘහ පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ අනුරාධපුර රාජධානියේ අවසාන භාගයේ දී ය. ගෙඩිගේ සම්ප්‍රදායේ ගොඩනැගිල්ලක වාස්තුවිද්‍යාත්මක වශයෙන් ප්‍රධාන කොටස් තුනක් හඳුනා ගත හැකිය. එනම් ගර්භය, මණ්ඩපය හා අන්තරාලයයි. ගෙඩිගේ සම්ප්‍රදායේ බිම් සැලැස්ම තුළ දැකිය හැකි ප්‍රධාන සංවර්ධන අවස්ථාව වූයේ අනුරාධපුර මධ්‍ය කාලයේ දක්නට තිබූ ගන්ධකුටි වර්ගයේ ප්‍රමුඛය ගෙඩිගේ බවට පරිවර්තනය වීමේ දී අන්තරාලය නමින් ද, ඊට ඉදිරි පසින් නවීන වශයෙන් තවත් අතිරේක කොටසක් වූ මණ්ඩපය නම් ආකෘතිය එයට සම්බන්ධ වීමය. මේ සංවර්ධනය අනුරාධපුර යුගයේ අවසාන සමයේ සිදු වූ බව බොහෝ පුරාවිද්‍යාඥයින්ගේ මතය වේ(ගුණවර්ධන 2010 :138).

**ඇතුළු නුවර ගෙඩිගේ**

අනුරාධපුර සමයට අයත් ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහ අතර පැරණිතම නිර්මාණය වන්නේ ඇතුළු නුවර පිහිටි අඩි 36×36 ප්‍රමාණයේ සම සතරැස් ගොඩනැගිල්ලයි. එහි පිටත බිත්ති අඩි පහක් පමණ ඝණකමින් යුක්තය. ගර්භ ගෘහය වටා අඩි 3.5 පළල ප්‍රදක්ෂිණා පථයක් ද නිර්මාණය කර ඇත. ඉහළ මාලයට ප්‍රවේශ වීම සඳහා පියගැට පෙළක් තිබූ බවට සාධක හමුවේ. පිටත බිත්ති මත බොරදම් සහිත කුළුණු දක්නට ලැබේ. ආලෝකය හා වාතාශ්‍රය ලැබීමට ගල් පුවරුවලින් සකසා ගත් කවුළු සවි කර ඇත.

**ජේතවන විහාර ප්‍රතිමාගෘහය**

අනුරාධපුර සමයට අයත් ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහයන් අතර ජේතවන විහාර ප්‍රතිමාගෘහය සුවිශේෂී නිර්මාණයකි. ජේතවනාරාමයෙ ඇති මෙම පිළිමගෙය 9වැනි සියවසයට හෝ ඊට පෙර කාලයට අයත් වේ. විශාල බිත්තිවලින් යුක්ත වන අතර වහලය ආරුක්කු හා ගෝලාකාර හැඩයෙන් යුක්ත ගඩොල් නිර්මාණයකි. මෙහි තිබූ ප්‍රතිමාව අඩි 30ක් පමණ උසකින් යුක්ත වන බව සේනක බණ්ඩාරනායක සඳහන් කරයි. වර්ග අඩි 70ක් පමණ විශාල වූ ප්‍රතිමාගෘහය නිර්මාණය කර ඇත්තේ පොළව මට්ටමින් අඩි 2.5 ක් පමණ උස් පාදමක් මතය. ආලෝකය හා වාතාශ්‍රය ලැබීමටකවුළු අටක් තිබූ බවට සාධක හමුවෙයි.

ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහයන්හි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණවල දියුණුව පිළිඹිබු කරන්නේ පොළොන්නරු යුගයේ දීය.

- ථූපාරාම ප්‍රතිමාගෘහය
- ලංකාතිලකප්‍රතිමාගෘහය
- තිවංකප්‍රතිමාගෘහය

**ථූපාරාම ප්‍රතිමාගෘහය**

පොළොන්නරු යුගය තුළ සිංහල ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ අතිවිශිෂ්ට නිර්මාණයන් ලෙස ගඩොලින් නිමවන ලද බොකු වහලක් ඇති ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහයකට හොඳම නිදර්ශනය ථූපාරාම පිළිමගෙය වේ. ඇතැම් විද්වතුන්ගේ මතය වන්නේ මෙය විජයබාහු රජුගේ කාලයේ ගොඩනංවන ලද බවය. දිගින් අඩි 84 අඟල් 6ක් ද පළලින් ගර්භ ගෘහයක් අඩි 52යි අඟල් 6ක් ද වේ.

**ලංකාතිලක ප්‍රතිමාගෘහය**

ලංකාතිලකයේ අභ්‍යන්තර ප්‍රතිමාගෘහය දිගින් අඩි 124ක් සහ පළල අඩි 66 කි. මාවත දෙපස භූමියේ පොළොව අඩි 2 අඟල් 4ක් වේ. උස් වූ ඇතුළු මාවත හතරැස් පැතිකඩ සහිත හිසකින් යුත්ත ගල්කණුවලින් පරිපූර්ණය. එක් පසකින් කුළුණු 17 කි. ඒ මත දැවයෙන් ඉදි කළ ඉහළ මාලකයක් තිබෙන්නට ඇති බව විශ්වාස කරනු ලැබේ. ඉහළ මාලයට ප්‍රවේශවීම සඳහා උතුරින් හා දකුණින් ප්‍රවේශ ශාලාවේ සිට පියගැට පේළි දෙකක් වෙයි. මෙය පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයක් බව උගතුන්ගේ පිළිගැනීමයි.

**තිවංක ප්‍රතිමාගෘහය**

මෙය පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයකි. ගඩොලින් සහ හුණු බදාමයෙන් නිර්මාණය කර ඇති මෙම පිළිමය නැමි තුනකින් යුක්ත වීම හේතුවෙන් තිවංක බුද්ධ ප්‍රතිමාව නම් විය. මෙම ප්‍රතිමාගෘහයේ දිග අඩි 133ක් ද පළල අඩි 67 අඟල් 6ක් ද වේ.

ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහයන්හි විශිෂ්ටතම තාක්ෂණික නිර්මාණය වනුයේ ගඩොලින්ම නිම වූ පියස්සයි. අනුරාධපුර යුගයට අයත් මෙම සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහවල පියස්ස ඉතිරි වී නොමැත. පොළොන්නරුවේ ථූපාරාම ප්‍රතිමාගෘහය පියස්ස ඉතිරි වි තිබෙන එකම ප්‍රතිමාගෘහය වේ. ඉපැරණි ශිල්පියා ප්‍රතිමාගෘහයේ බිත්තිය සනකම වැඩි කර තිබේ.

ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහයන් හි වාස්තුවිද්‍යාත්මක සැරසිලි අංග අතර මූර්ති,කැටයම් හා බිතුසිතුවම් දක්නට ලැබේ. ප්‍රතිමාගෘහයේ තැම්පත් කළ ප්‍රතිමාවට ප්‍රධාන ස්ථානයක් ලැබේ. ජේතවන විහාර ප්‍රතිමාගෘහයේ, ලංකාතිලක ප්‍රතිමාගෘහයේ හිටි බුද්ධ ප්‍රතිමා දක්නට ලැබෙන අතර ථූපාරාම ප්‍රතිමාගෘහයේ හිඳි ප්‍රතිමාවකි. පියගැට පෙළ, කොරවක්ගල, මුරගල හා සඳකඩ පහණ කැටයම් පිළිබඳ සාක්ෂි ලබා දෙයි.ලංකාතිලක ප්‍රතිමාගෘහය ථූපාරාම ප්‍රතිමාගෘහය එයට කදිම නිදසුන් ය. ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහයන් හි අභ්‍යන්තර බිත්ති සිතුවමින් අලංකාර කර තිබී ඇත. කාලයාගේ ඇවෑමෙන් අනුරාධපුර යුගයේ ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාගෘහයන් හි බිතුසිතුවම් ශේෂ වී නොමැත. පොළොන්නරු අවධියට අයත් ලංකාතිලක ප්‍රතිමාගෘහයේ උතුරු දෙසට මුහුණලා ඇති උප දොරටුවේ ආරුක්කුවේ ලියකම් මෝස්තරයක් සහිත සිතුවම් කොටසක් ඉතිරි වී තිබේ. මේ අනුව පැරණි වාස්තුවිද්‍යාව තුළ සුවිශේෂී ස්ථානයක් ප්‍රතිමාගෘහයට හිමි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

විමලජෝති හිමි, කීරම.(2004) *මහාවංසය.* (සංස්.). නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

රාහුල හිමි, වල්පොල.(1999) *ලක්දිව බුදුසමයේ ඉතිහාසය.*කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

පියසේන, ආර්. එච්. ඇම්.(2001) *සිංහල විශ්ව කෝෂය (10 වන කාණ්ඩය).* බත්තරමුල්ලඃ සංස්කෘතික දෙපාර්තමේන්තුව.